විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත**
**மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்**
**PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE**

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வது மாடி, ஜன ஜய சிட்டி வளாகம், நாவல வீதி, ராஜகிரிய No.628,10th Floor, Jana Jaya City Building, Nawala Road, Rajagiriya

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/EST02/03/SP | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2026.09. 17 |

ප්‍රධාන ලේකම් (බ.ප.)
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.)
පළාත් අධ්‍යක්ෂ, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බ.ප.)

**<u>බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුයුක්ත ආයතනවල සේවයේ නියුතු බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (කෘෂිකර්ම උපදේශක) I වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත කෘෂිකර්ම උපදේශක විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>**

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතනවල 2013, 2014, 2015, 2017, 2018 හා 2023 වර්ෂයන්ට අදාල බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (කෘෂිකර්ම උපදේශක) විශේෂ ශ්‍රේණියේ ඇතිවී ඇති පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බස්නාහිර පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුයුක්ත ආයතන වල සේවයේ නියුතු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (කෘෂිකර්ම උපදේශක) I වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර එම නිවේදනය මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

02. මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සහිත සියලු නිලධාරීන් (විශ්‍රාමික නිලධාරීන්ද ඇතුළුව) දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි. අදාල අයදුම්පත් එම නිවේදනය සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ යුතුය.

03. සෑම අයදුම්පත්‍රයක්ම බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් මගින් **<u>2026.10.08</u>** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ " ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), අංක 628, 10 වන මහල, ජනජය සිටි ගොනැගිල්ල, නාවල පාර, රාජගිරිය " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය තුය.

04. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

~~තිලක් සෙනරත්~~
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

011 2879614
ෆැක්ස් : 0112879512 – Ex: 511
ppscwpest@sltnet.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| ලේකම්<br>செயலாளர்<br>Secretary<br>011 2879528 | සහකාර ලේකම්<br>(කළමනාකරණ හා ප්‍රතිපත්ති)<br>உதவிச் செயலாளர்<br>(நிர்வாகம் மற்றும் கொள்கைகள்)<br>Assistant Secretary<br>(Management & Policies)<br>011 2879610 | සහකාර ලේකම්<br>(විභාග හා බඳවාගැනීම්)<br>உதவிச் செயலாளர்<br>(பரீட்சைகள் மற்றும் ஆட்சேர்ப்பு)<br>Assistant Secretary<br>(Examinations & Recruitment)<br>011 2879317 | සහකාර ලේකම්<br>(ආයතන හා ගිණුම්)<br>உதவிச் செயலாளர்<br>(தாபனம் மற்றும் நிதி)<br>Assistant Secretary<br>(Establishment & Accounts)<br>011 2879538 | පරිපාලන නිලධාරි<br>நிர்வாக உத்தியோகத்தர்<br>Administrative Officer<br>011 2879517 | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879614<br>ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2879512<br>ඊ-මේල් / ஈமெயில் / E-Mail: ppscwpse@sltnet.lk |

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (කෘෂිකර්ම උපදේශක) I වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත කෘෂිකර්ම උපදේශක විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

බස්නාහිර පළාත් සභා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (කෘෂිකර්ම උපදේශක) විශේෂ ශ්‍රේණියේ 2013, 2014, 2015, 2017, 2018 හා 2023 වර්ෂවල ඇතිවී ඇති පහත සඳහන් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ යෙදී සිටින හා විශ්‍රාමික බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (කෘෂිකර්ම උපදේශක) I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| පුරප්පාඩු ඇති වූ වර්ෂය | පුරප්පාඩු ඇති වූ දිනය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|
| 2013 | 2013.10.15 | 03 |
| | 2013.10.25 | 01 |
| මුළු පුරප්පාඩු ප්‍රමාණය | | **04** |
| 2014 | 2014.12.14 | 01 |
| | 2014.12.17 | 01 |
| | 2014.12.21 | 01 |
| මුළු පුරප්පාඩු ප්‍රමාණය | | **03** |
| 2015 | 2015.10.01 | 01 |
| | 2015.11.02 | 01 |
| මුළු පුරප්පාඩු ප්‍රමාණය | | **02** |
| 2017 | 2017.04.10 | 01 |
| | 2017.10.26 | 01 |
| මුළු පුරප්පාඩු ප්‍රමාණය | | **02** |
| 2018 | 2018.05.11 | 01 |
| | 2018.07.15 | 01 |
| මුළු පුරප්පාඩු ප්‍රමාණය | | **02** |
| 2023 | 2023.06.14 | 01 |
| | 2023.10.21 | 01 |
| මුළු පුරප්පාඩු ප්‍රමාණය | | **02** |

සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය -

ඉහත පුරප්පාඩු ඇතිවූ දිනයන්ට පහත 04 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**අයදුම්පත් කැඳවන අවසාන දිනය : 2026.10.08**

02. බඳවා ගන්නා ආකාරය

I. බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.09.26 දිනැතිව අනුමත කරන ලද හා 2025.01.08 දිනැතිව සංශෝධනය කරන ලද 2013.06.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (කෘෂිකර්ම උපදේශක) තනතුරට බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියේ 10.3.4 ඡේදයට අනුව ඇමුණුම 06 සඳහන් නිර්ණායක යටතේ පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

II. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල අනුව හා අදාළ සෙසු අවශ්‍යතා සපුරා ඇති බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (කෘෂිකර්ම උපදේශක) විශේෂ ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

03. **මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය**

2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා උසස්වීම් ලබන නිලධාරීන්ට
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(IV) හි MN-7-2006-A හි 04 වන වැටුප් පියවර
රු.20,030 – 11 x 365-18 x 500 - 33,045

2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා උසස්වීම් ලබන නිලධාරීන්ට
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි MN- 7 2016 හි 04 වන වැටුප් පියවර
රු.41,580- 11 x 755 –18 x 1030 – 68,425/-

04. **සුදුසුකම්**

I. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ කෘෂිකර්ම උපදේශක I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06)ම උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ පාලන චක්‍රලේඛ 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

V. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම. (බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ කෘෂිකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන 2013.06.01 දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (කෘෂිකර්ම උපදේශක) I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. (බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 08 ඡේදයේ සටහන)

05. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්**

| අනු අංකය | ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| **01** | **සේවා පළපුරුද්ද**<br>අදාළ මූලික සුදුසුකම ඉක්මවා සපුරා ඇති බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක I වන ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය (එක් වසරක් වෙනුවෙන් ලකුණු 05 බැගින්)<br>(පාලන චක්‍රලේඛ 01/2022 අනුව ලකුණු ලබාදෙනු ලැබේ) | | 50 | අදාළ නොවේ |
| **02** | කුසලතාවය<br>කාර්ය සාධනය (ආසන්න වසර 05ක් සඳහා) | | 10 | අදාළ නොවේ |
| | ඉතා හොඳයි | 02 | | |
| | හොඳයි | 01 | | |
| **03** | **වෘත්තීය සුදුසුකම් හා අමතර අධ්‍යාපන සුදුසුකම්**<br>3.1 අමතර අධ්‍යාපන සුදුසුකම් | | 07 | අදාළ නොවේ |
| | 3.1.1 රජය පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ උපාධියක් සඳහා | 05 | | |
| | 3.1.2 රජය පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද තොරතුරු තාක්ෂණ පාඨමාලා සහතිකයක් සඳහා ( පාඨමාලා කාල සීමාව අවම වශයෙන් මාස 06 කි)<br>( උපරිම එක් උපාධි සහතිකයක් සහ තොරතුරු තාක්ෂණ පාඨමාලා සහතිකයකට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ. ඒ සඳහා සහතික පත්‍ර ඉදිරිපත් කළ යුතුය) | 02 | | |
| | **3.2** **කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ සුදුසුකම්** | | 12 | |

| | | | | |
|---|---|---|---|---|
| | (එක් එක් අංශයන්හි සේවය කිරීම වෙනුවෙන් ඊට අදාළ සම්පූර්ණ ලකුණු ලබා ගැනීම සඳහා එක් අංශයක අවම වශයෙන් වසර 03ක් සේවය තිබිය යුතුය. අවසන් වර්ෂ තුනෙහි නිර්දේශ මෙහිදී සලකා බලනු ලැබේ.) | | | අදාළ නොවේ |
| | **3.2.1 දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානවල හෝ බෝඹුවල සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ හෝ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ සේවය කිරීම සඳහා** | | | |
| | **3.2.1.1 දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයක සේවය කිරීම** | | | |
| | A. වාර්ෂික ගොවිපල ආදායම් ඉලක්ක සපුරාලීම සඳහා - වසරකට ලකුණු 01 බැගින් | 03 | | |
| | B. ආදර්ශ පුහුණු ක්ෂේත්‍ර නඩත්තුව හා සංවර්ධනය සඳහා ලබාදෙන සක්‍රීය දායකත්වය - වසරකට එක් ක්ෂේත්‍ර දිනයක් සඳහා ලකුණු 01 බැගින් | 03 | | |
| | C. NVQ පුහුණු පාඨමාලා සඳහා දක්වන ලද දායකත්වය වසරකට ලකුණු 01 බැගින් | 03 | | |
| | D. ගොවි පුහුණු පාඨමාලා සඳහා දක්වන දායකත්වය වසරකට ලකුණු 01 බැගින් | 03 | | |
| | **3.2.1.2 සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ සේවය කිරීම** | | | |
| | A. වාර්ෂික ගොවිපල ආදායම් ඉලක්ක සපුරා ලීම සඳහා - වසරකට ලකුණු 01 බැගින් | 03 | | |
| | B. විශේෂ තාක්ෂණ ප්‍රවර්ධන කටයුතු සඳහා දක්වන ලද දායකත්වය සඳහා වසරකට ලකුණු 01 බැගින් | 03 | | |
| | C. ආදර්ශ පුහුණු ක්ෂේත්‍ර නඩත්තුව හා සංවර්ධනය සඳහා ලබාදෙන ලද සක්‍රීය දායකත්වය සඳහා - වසරකට එක් ක්ෂේත්‍ර දිනයකට ලකුණු 01 බැගින් | 03 | | |
| | D. පුහුණු වැඩසටහන් පැවැත්වීම කෙරෙහි ලබාදෙන ලද සක්‍රීය දායකත්වය සඳහා - වසරකට ලකුණු 01 බැගින් | 03 | | |
| | **3.2.1.3 පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ සේවය කිරීම** | | | |
| | A. පළාත තුළ කෘෂිකාර්මික ව්‍යාප්තිය පවත්වා ගැනීම සඳහා ශ්‍රව්‍ය, දෘශ්‍ය , මුද්‍රිත හා අන්තර්ජාල (වෙබ් අඩවිය) මගින් ලබාදෙන ලද දායකත්වය සඳහා වසරකට ලකුණු 01 බැගින් | 03 | | |
| | B. සම්මන්ත්‍රණ, සාකච්ඡා, රැස්වීම්, උත්සව ආදිය ආවරණය කරමින් කෘෂිකාර්මික දත්ත, වාර්තා හා වැඩසටහන්, සැලසුම් සැකසීමට ලබාදෙන සක්‍රීය දායකත්වය සඳහා - වසරකට ලකුණු 01 බැගින් | 03 | | |
| | C. පළාත තුළ සාමාන්‍ය ව්‍යාප්තියට අදාළව දක්වන ලද සක්‍රීය දායකත්වය සඳහා - වසරකට ලකුණු 01 බැගින් | 03 | | |
| | D. NVQ පුහුණු පාඨමාලා සඳහා දක්වන ලද දායකත්වය සඳහා - වසරකට ලකුණු 01 බැගින් | 03 | | |
| | **3.2.2 නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) කාර්යාල සහ කෘෂිකර්ම උපදේශක උප කාර්යාලවල සේවය කිරීම** | | 12 | |
| | A. ව්‍යාප්ති / බෝග නිෂ්පාදන / සංවර්ධන වැඩසටහන් සඳහා නිලධාරියාගේ දායකත්වය පිළිබඳ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය - තම ක්ෂේත්‍රයට අදාළව ක්ෂේත්‍ර දින පැවැත්වීම සඳහා වසරකට ලකුණු 01 බැගින් | 04 | | |
| | B. අත්තිකාරම් ගිණුමට නිලධාරියාගේ දායකත්වය පිළිබඳ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කරන ලද වාර්තාව | 04 | | |
| | C. පවත්වන ලද ජංගම අලෙවි ප්‍රවර්ධන කටයුතු | 02 | | |
| | D. තාක්ෂණ ප්‍රචාරණය සඳහා ( යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP), ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ වැඩසටහන (IPM), ආරක්ෂිත ගෘහ තුළ වගාව, වැසි | 02 | | |

| | | | | |
|---|---|---|---|---|
| | ආවරණ තුළ වගාව, බිත්තර වී ගොවිපළ ඇති කිරීම, ක්ෂුද්‍ර ජලසම්පාදන ක්‍රම ප්‍රචාරණය කිරීම, වර්ග අත්හදා බැලීම, ප්‍රදර්ශන පැවැත්වීම හා වෙනත්) | | | |
| 04 | කෘෂිකාර්මික සංවර්ධනයට දක්වන ලද දායකත්වය | | 04 | අදාළ නොවේ |
| | A. කෘෂිකර්මාන්තයට අදාළ නව නිර්මාණ | 02 | | |
| | B. යාන්ත්‍රිකරණයට දක්වන ලද දායකත්වය (පැල සිටුවීමේ යන්ත්‍ර, බීජ වප්කර, වල් නෙලන යන්ත්‍ර, අතුරු යත් ගෑමේ උපකරණ භාවිතයට දක්වන ලද දායකත්වය මෙහිදී සලකා බලනු ලැබේ) | 01 | | |
| | C. පුවත්පත් සඟරා සඳහා ලිපි ඉදිරිපත් කිරීම | 01 | | |
| 05 | ප්‍රශංසා හා ඇගයීම් (පොදු 230 බී ආකෘතිය යටතේ ලබා ඇති එක් සහතිකයක් සඳහා ලකුණු 01 බැගින් උපරිම ලකුණු 03) | 03 | 03 | අදාළ නොවේ |
| 06 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද දායකත්වය | | 02 | අදාළ නොවේ |
| | මුළු ලකුණු | | 100 | අදාළ නොවේ |

06. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (කෘෂිකර්ම උපදේශක) විශේෂ ශ්‍රේණියේ තනතුරට උසස් කිරීම සඳහා වන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ යුතුය.

07. සෑම අයදුම්පත්‍රයක්ම නියමිත ධූරාවලිය මගින් <u>2026.10.08</u> දිනට පෙර හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "<u>බස්නාහිර පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (කෘෂිකර්ම උපදේශක) විශේෂ ශ්‍රේණියේ තනතුරට උසස් කිරීම</u>" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

08. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

09. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk යන නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

2026 සැප්තැම්බර් මස 16 වන දින

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත